# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 07

✻ ✻ ✻ ✻ ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත ✻ ✻ ✻ ✻
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

OCTOBER 10, 2008 ඔක්තෝබර් මාසය (බුද්ධ වර්ෂ 2552 වප් මාසය)




# කොටි උගුල්

♦ සංජය විමලරත්න

**මේ** ලිපිය ලියන මොහොතේ අපේ වික්‍රමාන්විත සන්නද්ධ හමුදාවෝ කොටි මූලස්ථානය පිහිටි කිලිනොච්චි නගරය අල්ලාගැන්මට අසන්නව සිටිති. අපේ ගුවන් හමුදාවේ ප්‍රහාරක යානා වේලුපිල්ලේ ප්‍රභාකරන් සහ නඩේසන් ප්‍රධාන කොටි ත්‍රස්තවාදී නායකයින් සැඟවී සිටින බංකර ඇතුළත් මධ්‍ය ලක්ෂයට පහර දී ඇති අතර, මෙහිදී කොටින්ගේ එකම ගැලවුම වන්නේ ඔවුන්ගේ අවසාන සැඟවුම් තිප්පල වන මුලතිව් කැලෑවට පසුබැස පැනයාමය.

බොහෝ නිරීක්ෂකයින්ගේ අදහස නම් මෙතෙක් තම මූලස්ථානය යන වෙන් ලෝකයාට බොරු ගාම්භීරත්ව යක් මවා පාගෙන සිටි තැන ද දමා පැනයන්නට වීම කොටින්ට අත්වූ පරාජයක් සහ මහත් බාධකයක්ද වන බවයි. මෙවැන්නක් සිදුවන්නේ කොටි තම මූලස්ථානය ලෙස අල්ලාගෙන නම්කරගෙන සිටි යාපනයෙන් ශ්‍රීලංකා හමුදා විසින් උන් පන්නා හරිනු ලැබීමෙන් වසර 15 කට පසුව ය.

පසුගිය සැප්තැම්බර් අවසාන සතියේ නිව් ස්ටේට්ස්මන් **New Statesman** සඟරාවේ ලිපියක මෙසේ ලියා ඇත.

"ශ්‍රීලංකා රජය මේ වසර මුල සිට විවිධ අංශවලින් ප්‍රහාර දීම නොකඩවා කරගෙන යයි. ගිය ජූලි මස ඔවුන්ට මන්නාරම් තුඩුව අත්පත්කරගත හැකි විය. මේ මගින් කොටින්ට ඉන්දියාව සමග තිබූ වැදගත්ම මුහුදු සම්බන්ධය කපාහැරිණ. ඊළඟට, සැප්තැම්බර් මස ශ්‍රීලංකා හමුදාවෝ මුළු මන්නාරම ම ආපසු අත්පත්කරගත්හ. දැන් ඒ හමුදා මන්නාරමෙන් උතුරු හා නැගෙණහිර දෙසින් කිලිනොච්චිය දෙසට සීරුවෙන් ගමන්කර කොටි මූලස්ථානයට සමීපව සිටිති. මනාව සැළසුම් කරන ලද උසස් ගණයේ ගුවන් ප්‍රහාර හා භූමිය මීටර් **40** ක් ගැඹුරට පසා කර ගෙන යන බෝම්බ ද කොටින්ගේ බංකර විනාශ කර දැමීමට සමත්ව ඇත."

මේ ලිපියේ තවත් දෙයක් පෙන්වා දෙයි. එනම් කරුණා තම සගයින් 6000 ක් සමග කොටි සංවිධානයෙන් ඉවත්වී යාම ප්‍රභාකරන්ට විශාල පාඩුවක් වූ බවයි. එය කොටින්ගේ පිරිස් බලයෙන් 60% ක් අඩුවීමකි. නැගෙණහිර පළාත හමුදාව අතට පත්වීමට එය මූලික හේතුව විය. නැගෙණහිර මැතිවරණ පවත්වා දැන් එහි සිවිල් පාලනයක් ඇතිකිරීමට හැකිව ඇත. තමන් අල්ලා ගෙන සිටි බිම් ප්‍රමාණ අහිමි වී ගිය බව දැන් කොටි ද පිලිගනිති.

තවත් හේතුවක් නිව් ස්ටේට්ස්මන් සඟරාව පෙන්වා දෙයි. එනම් කොටින්ගේ ආදායම් හීනවීමයි. කලක් වසරකට ඩොලර් මිලියන 300 ක් එකතුකරගත් කොටි සංවිධානයට ඇමරිකාව හා යුරෝපීය රටවල පනවා ඇති කොටි තහනම නිසා ඒ එන මුදල් විශාල ප්‍රමාණයක් නැවතී ගොස් දැන් ලැබෙන්නේ සොච්චමකි. ඊළඟම පළාතකවත් එන පාටක් නැති නිසා විදේශී දෙමළ ජනතාව කොටින්ට සල්ලි දීම ප්‍රතික්ෂේප කර ඇත. එසේම කොටි දෙමළ ජනයාගේ ගැලවුම් කාරයන්යයි මෙතෙක් සිතා ගෙන සිටි දේ අමූලික බොරුවක් බවද දැන් බොහෝ දෙමළ ජනතාව වටහා ගෙන සිටිතැයිද මේ සියළු දෑ කොටින්ගේ පරාජය ඉක්මන්කර ඇති බව ද එම ලිපිය පෙන්වා දෙයි.

කාරණා මෙසේ පෙන්නුම් කරන මුත් සැඟවුණු අන්තරායන් ගැන අප ඉතා ප්‍රවේසම්විය යුතුය. මින් එහාට තවත් බොහෝ බොරු වළවල් සහ උගුල් තිබිබිය හැකිය. කොටි හැමවිටම අනුකම්පාවක් නැති කෲර ජාතියක් බව සිතිය යුතුය. පරදින්නට යන අවසාන සටනට උන් වියරු වැටී මුහුණ දෙන බව අපි දනිමු. හමුදාවට බියෙන් ඔවුන් පස්සෙන් පස්සට පලා ගියාද, උපක්‍රමශීලීව උවමනාවෙන් මුලතිව් ඝන කැලෑව අභ්‍යන්තරයට වැදුනාද යන්න කල්පනාවෙන් සිතා බැලිය යුතුවෙයි.

ඊසාන දිග මෝසම් වැසි ඉදිරි මාසවල කඩා වැටෙන්නට නියමිතය. තද වැස්ස මගින් මෙම වනාන්තර තනිකර ලිස්සන එරෙන මඩවගුරු බවට පෙරළේ. කාල තුවක්කු වැනි විශාල ප්‍රහාරක ආයුධ මෙම මඩවගුරුවල එරී ප්‍රයෝජනයක් ගත නොහැකි තත්වයකට පත්වන්නේය. එවිට තත්වය තනි තනි පුද්ගලයින් අතර සටනට පමණක් සීමා වෙනවා ඇත. කොටි එවැනි අවස්ථාවක් බලාපොරොත්තුව සිටිනවා නිසැකය. ඔවුන් එවැනි ගරිල්ලා ක්‍රමයන්ට පුරුදු බව අපි දනිමු

එසේම මේ අවස්ථාවේම කොටි තම මරාගෙන මැරෙන කාඩරයන් යවා කොළඹ හා දකුණේ ද, වෙනත් ප්‍රධාන නගරවල ද බෝම්බ පුපුරවා ජනතාව හා ප්‍රභූ පුද්ගලයන් ඝාතනය කිරීම අරඹනවා ඇත. සිවිල් සමාජය අවුල් සහගත තත්වයකට පත්කිරීම කොටින්ගේ අරමුණයි. එසේම කොටි රසායනික ද්‍රව්‍ය සටනේදී භාවිතා කරන්නටද ඉඩ ඇත. ඒ ගැන කරුණාද අනතුරු අඟවා තිබේ. කෙසේ වුවද අපේ සන්නද්ධ හමුදා පසුගිය වසර කීපය තුළ ලබා ඇති පළපුරුද්ද මත මේ සියළු දේ ගැන සිතා බලා ඇතිවාට සැක නැත. ඔවුන් මේ සියළු බාධකයන්ට සාර්ථකව මුහුණ දෙනවා ඇත යන්න අපේ විශ්වාසයයි.

යුද්ධය පවතින ප්‍රදේශයේ සිටි සිවිල් වැසියන් රජයෙන් මුදාගත් ප්‍රදේශවලට ගලා ඒම සිදුවෙමින් පවතින නමුත් තවමත් එක්තරා ප්‍රමාණයක් ද්‍රවිඩ වැසියන් මුලතිව් කැලෑවට

4 වන පිටුව බලන්න →

යන් තම් හෙලවුනොත් හෙම මෙමා හිස සලා
රුං ගා ඉගිල යන්නෙ ද මිතුරු සම නලා
සන් සුන් ලෙසින් පැය ගණනක්ම එක හෙළා
ඉන් නම් නුඹයි මගෙ සිත බැඳුණු සුර තලා

If I move slightly or my head a little I bend
You'd rapidly fly away my butterfly friend
Hours and hours on end at standstill set
I'd be, 'cos you are the most adorable pet

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ransinghe*




ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/





ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG
FAST CASH
SEND TODAY - COLLECT TODAY


විස්තර පිටු අංක 3